**ශීර්ෂය 315 – උතුරු පලාත් සභාව - 2025**

**---------------------------------------------**

## 01. දැක්ම, මෙහෙවර හා ප්‍රධාන කාර්යභාරයන්

### 1.1 දැක්ම

උතුරේ ජනතාවගේ අපේක්ෂාවන් තෘප්තිමත් කිරීම උදෙසා යහපාලනය ක්‍රමවත්ව ක්‍රියාත්මක කිරීම මගින් තිරසාර සංවර්ධනය සහිතව සමෘද්ධිමත් බව ලඟාකර ගැනීමට අරමුණු කර ගැනීම.

### 1.2 මෙහෙවර

උතුරේ ජනතාව ඉලක්ක කර ගනිමින් යටිතල පහසුකම් පුනරුත්ථාපනය කිරීමත් සමග සේවා හා පහසුකම් නැවත සක්‍රීය කිරීම මගින් ජීවනෝපාය ගොඩනැගීම සහ මානව සම්පත් ධාරිතාවන් සංවර්ධනය කිරීම.

### 1.3 ප්‍රධාන කාර්යභාරයන්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ සමගාමී ලැයිස්තුවේ සහ පළාත් සභා ලැයිස්තුවේ දක්වා ඇති කර්තව්‍යන් ඉටු කිරීම.

## 2. මූල්‍ය ප්‍රකාශන

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

උතුරු පළාත් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 53,288.57ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 52,719.87ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව, ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 568.7ක් හෙවත් සියයට 1.06ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2025 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිවීම් ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිවීම් | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 43,564.99 | 43,353.99 | 211.00 | 0.48 |
| ප්‍රාග්ධන | 9,723.58 | 9,365.88 | 357.70 | 3.67 |
| | **53,288.57** | **52,719.87** | **568.70** | **1.06** |

## 3. විගණන නිරීක්ෂණය

ඉහත ශීර්ෂය යටතේ පාර්ලිමේන්තුව විසින් සලසා දුන් ප්‍රතිපාදන පළාත් සභා අරමුදල යටතේ ගිණුම්ගත කර ඒ අනුව උපයෝජනය කර තිබුණි. පළාත් සභා අරමුදල පිළිබඳ විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.